රුහුණ විශ්වවිද්‍යාලය

2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 3000 ස්ථලය
පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්

SLA 3103 – සිංහල පද්‍ය සාහිත්‍යය II

පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න

කාලය : පැය 03

---

01. පහත සඳහන් පද්‍යවල අර්ථ ලිඛිල් බසින් ලියන්න.

(අ) දවස පුරා දිවැ වහළෙව් උදය වරා
අවර'ඹරා පත් වරැ තරඟ'තින් දරා
සරත දුරා කැරැ නහවනුව සමුදුරා
සහස කරා කර ඇදි වැන්නැ තම කරා

පියයුරු අඳුරු තුරු සළු පටිනි වසමිනි
නිසකත එසඳැ එත සිය කර හකුළමිනි
පරදර වරද වරමින් වර ගුණ සිතිනි
සියකුල සිරිත රිවි මුළු ලොවට පැ වැනි

මයුර සන්දේශය : සංස්. කුමාරතුංග මුනිදාස

(ආ) රුතිවන පෙති නැ'විදින් සමුවෝයා
නිති මියුරැති වෙණ නද උමුවෝයා
සිතිවිලි නැති රූ විලස මුවෝයා
තැති නොගනිති මිනිසුන් හමුවෝයා

නොගොසින් සිට සිටිවන නිබදේයා
වෙසෙසින් සුරනර සෙන් නොමදේයා
සතොසින් විඳ විඳ ලොබ නොසිදේයා
මෙලෙසින් වෙණ නද අසන සදේයා

ගුත්තිල කාව්‍ය : සංස්. සුචරිත ගම්ලත්



26

(ඇ) බාතියරජවන් පැරකුම් දිනරඳ
ජෝතිය වත සිවු රඟ සෙන් රැස් කඳ
ජෝතිය සිටු නරවර ගන'ඳර කඳ
බීතිය කැරැ ගියෙ පරසක්වළ වැද

නැරිය ජයමන් පෙර සිට පුරුදු
වීරිය බලවිකුමෙන් සරි මිගිඳු
ආරිය සක්විති රජකුල කුමුදු
සූරිය හිමි දින පැරකුම් නිරිඳු

පැරකුම්බා සිරිත: සංස්. සිරි තිලකසිරි

(ඈ) මෙර මතිනි දියබඳ
කිරිසයුර අළලන සඳ
නැඟි දියකඳ පබඳ
වැන්න පිළිමිණි පවුර මනනඳ

දුටුවන් වන පිරිය
නිමල සිරිලඹ සපිරිය
එනුවර මහ පිරිය
කෙරේ සොර සතුරන්ට අපිරිය

සඳකිඳුරුදාව: සංස්. මකුළුදූවේ පියරතන හිමි

(ලකුණු 28)

02. ආරම්භයේ සිට කෝට්ටේ යුගය දක්වා සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යයෙහි සුවිශේෂ සන්ධිස්ථාන සමාලෝචනය කරන්න.

03. පෙළ සාහිත්‍යයෙහි නිරූපිත දේවදත්ත චරිතය ගුත්තිල කතෘවරයා විසින් ප්‍රතිනිර්මාණය කෙරෙන අයුරු සන්සන්දනාත්මක ව පරීක්ෂා කරන්න.

04. භාෂාව හා ආකෘතිය පිළිබඳ අවධානය යොමු කරමින් සඳකිඳුරු දා කවෙහි පැනෙන ජනකවි අභාසය සනිදර්ශනව විභාග කරන්න.

05. "මහනුවර යුගයෙන් පබැඳුණු විරිදු කවිවල නිරූපිත දුර්වලතා පැරකුම්බා සිරිතෙන් දර්ශනය නො වේ." මෙයට පක්ෂව හෝ විපක්ෂව නිදර්ශනාත්මක විග්‍රහයක යෙදෙන්න.

06. "උපමා භාවිතයෙන් සදුපදේශ සහෘදයා වෙතට ගෙනයාම උපදේශ සාහිත්‍යයෙහි විශේෂ ලක්ෂණයකි." සාකච්ඡා කරන්න.

07. "මයුර සන්දේශයේ බොහෝ වර්ණනා වඩාත් රසවත් හා අර්ථවත් වන්නේ කවර කරුණු නිසා දැ'යි විමසන්න.

(ප්‍රශ්න 02 – 07 දක්වා පිළිතුරුවලට ලකුණු 13 බැගිනි.)

@@@@@@@